# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

## පුරප්පාඩු නිවේදනය

2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙරට බහුවිධ යටිතල පහසුකම් නියාමන ආයතනය වශයෙන් ස්ථාපිත කර ඇත. 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත සම්මත කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව විදුලිබල කර්මාන්තයේ ආර්ථික, ආරක්ෂණ හා තාක්ෂණ නියාමන ආයතනය වශයෙන් ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පහත සඳහන් තනතුර පිරවීම සඳහා ප්‍රතිඵල කේන්ද්‍ර කරගත් වෘත්තිකයන් සොයයි.

## අභ්‍යන්තර විගණක

- කළමනාකරණ මට්ටම : නියෝජ්‍ය අධ්‍යක්ෂ
- වාර්තාකරණ සම්බන්ධතාවය: සභාපති, මහජන උපයෝගිතා කොමිෂන් සභාව

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මූල්‍ය/ ගිණුම්කරණය/ආර්ථික විද්‍යාව/වාණිජ්‍ය/ කළමනාකරණය පිළිබඳ උපාධිය (SLQFL 6 හෝ ඊට සමාන සුදුසුකමක්)

සහ

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මූල්‍ය/ ගිණුම්කරණය/ආර්ථික විද්‍යාව/වාණිජ්‍ය/ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (SLQFL 10 හෝ ඊට සමාන සුදුසුකමක්)

සහ

- ACA/ ACCA/ ACMA හෝ CIA වෘත්තීය සුදුසුකමක් ලෙස තිබිය යුතුය

සහ

- ප්‍රථම උපාධිය ලබාගත් පසු, අවම වශයෙන් වසර දහය (10) ක කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, එම පළපුරුද්දෙන් අවම වශයෙන් වසර පහක් (05) මධ්‍යම කළමනාකරණ මට්ටමේ විය යුතුය

- වයස: අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**පොදු කොන්දේසි**

- ඉහත තනතුර සඳහා ආකර්ෂණීය වැටුපක් හා අනෙකුත් ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සුදුසුකම්ලත් අයදුම්කරුවන් ලෙස සැලකෙනු ඇත.
- සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර, තනතුරේ කාර්යභාරය සුමට ලෙස ඉටු කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. එමෙන්ම, යහපත් චරිතයක් සහිත අයෙකු විය යුතුය.
- සුදුසුකම් සහ පලපුරුද්ද අනුව තෝරාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණ හා තරග විභාගය සඳහා ලබාගන්නා ලකුණු පදනම් කරගෙන තෝරාගැනීම සිදු කෙරේ
- අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකතන අංක, උපන් දිනය, වයස, පුරවැසිභාවය, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද, වෙනත් තොරතුරු සහ අයදුම්කරු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කල හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකතන අංක ඇතුලත් කර සකසන ලද අයදුම්පත් ආවරණ ලිපියද සමඟ 2025.11.27 දින හෝ එදිනට පෙර එවිය යුතු වේ.
- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහල කොටසේ හෝ ඊමේල් පණිවිඩයේ විෂය තීරයෙහි අයදුම්කරන තනතුර සඳහන් කල යුතු ය.

ලිපිනය : අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
6 වන මහළ, ලංකා බැංකු වෙළඳ කුළුණ,
28, ශාන්ත මයිකල් පාර,
කොළඹ - 03.

ඊමේල්: careers@pucsl.gov.lk
දුරකතනය: 011-2392608/7
වෙබ්අඩවිය: www.pucsl.gov.lk

සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

13.11.2025